දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 784807, 784832

ලේකම් / செயலாளர் / Secretary — 784811

කාර්යාලය / அலுவலகம் / Office — 785141-50, Fax: 784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

மனிதவள அபிவிருத்தி, கல்வி, பண்பாட்டு அலுவல்கள் அமைச்சு

Ministry of Human Resource Development, Education & Cultural Affairs

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල.

'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல.

"Isurupaya", Sri Jayawardhanapura Kotte. Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව,

ඔබේ අංකය / உமது இல. / Your No. } ....................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/01/07/01

චක්‍රලේඛ අංක. 2004/15

දිනය / திகதி / Date } 2004 04. 27

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පාසල්වල විදුහල්පතිවරුන්,
පරිවේනාධිපති හිමිවරුන් වෙත.

## 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල මත ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම සඳහා සලකා බලන දෙමාපියන්ගේ/ නිත්‍යානුකූල භාරකරුවන්ගේ වාර්ෂික ආදායම් සීමාව සංශෝධනය කිරීම

5 වන ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් අතරින් ශිෂ්‍යාධාර හිමිවීමට අදාල වාර්ෂික ආදායම් සීමාව සංශෝධනය කරමින් අධ්‍යාපන ලේකම්ගේ එච්.ආර්.ඩී./ඊ.කිවු.ඩී./2002/20 අංක හා 2002.08.15 දිනැති චක්‍රලේඛයෙහි 03 වන ඡේදයෙහි සඳහන් කරුණු 02 කට අතිරේකව පහත සඳහන් වගන්තිද එකතු කරනු ලබන බව කාරුණිකව දන්වමි.

III. 2003 වර්ෂයට පෙර දෙමාපියන්ගේ වාර්ෂික ආදායම් සීමාව රු.6000 හෝ ඊට අඩු තත්වයන් යටතේ ශිෂ්‍යාධාර හිමිකම් ලැබූ සිසුන්ගේ ශිෂ්‍යාධාර හිමිකම් ලැබීමේ වර්තමාන ආදායම් සීමාව 2003 ජනවාරි මාසයේ සිට රු.24000 ලෙස සංශෝධනය කරනු ලැබේ.

IV. ඒ අනුව දැනටමත් ශිෂ්‍යාධාර ලබන සිසුවෙකුගේ දෙමාපියන්ගේ ආදායම රු. 24,000 දක්වා වාර්ෂිකව වැඩිවුවද එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටද ශිෂ්‍යාධාර ගෙවීමට කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි. කෙසේ වුවද මෙම වෙනස් කිරීම පදනම් කරගෙන 2003 වර්ෂයට පෙරාතුව ශිෂ්‍යත්ව විභාගය සමත්ව දැනට ශිෂ්‍යාධාර නොලබන සිසුන් සඳහා ශිෂ්‍යාධාර හිමිකම් නොලැබෙන බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

වෛද්‍ය තාරා ද මෙල්,
ලේකම්,
මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

පිටපත්

i. විභාග කොමසාරිස් ජනරාල්,
ii. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව,
iii. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය,
iv. ප්‍රධාන ගණකාධිකාරී,මානව සම්පත් සංවර්ධන අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
v. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්.